ද මැසිනෝද් විදුහල - කඳාන

De Mazenod College – Kandana

ඉතිහාසය

2024-06

පළමුවන වාර පරීක්ෂණය - 2024

09 ශ්‍රේණිය

පැය 02 යි

සැලකිය යුතුයි

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න*
- *අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න*

## I කොටස

1) ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගෙන සිටි වසර ගණන වන්නේ,
   1. අවුරුදු 138
   2. අවුරුදු 153
   3. අවුරුදු 133
   4. අවුරුදු 119

2) පළමුවන විමලධර්මසූරිය රජතුමා හමුවූ ප්‍රථම ලන්දේසි දූතයා වන්නේ,
   1. කොරනේලියස් වැකල්
   2. ජෙරාඩ් හල්ෆ්ට්
   3. ජොරිස් වැන් ස්පිල්බර්ජන්
   4. කලන් අල්බස්

3) එකල පෘතුගාලය යටත්ව තිබූ රට කුමක්ද?
   1. ගෝවා
   2. එංගලන්තය
   3. ස්පාඤ්ඤය
   4. ප්‍රංශය

Learning Resource Center
De Mazenod College
Kandana

4) ඉංග්‍රීසින් මෙරට මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගන්නා ලද වර්ෂය වන්නේ,
   1. ක්‍රි.ව 1795
   2. ක්‍රි.ව 1796
   3. ක්‍රි.ව 1798
   4. ක්‍රි.ව 1802

5) මහා අස්ථාන කුමරු රජ වූ නාමය වන්නේ,
   1. පළමුවන රාජසිංහ රජු
   2. සීතාවක රාජසිංහ රජු
   3. දෙවන රාජසිංහ රජු
   4. දෙවන විමලධර්මසූරිය රජු

6) ලන්දේසීන් ගෙන ගිය කොමාන්ඩරි ගණන වන්නේ,
   1. 1 යි
   2. 2 යි
   3. 3 යි
   4. 4 යි

7) ලන්දේසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය වනුයේ,
   1. ගෝව
   2. සුමාත්‍රා
   3. මදුරාසිය
   4. බතාවිය

8) 1638 ගිවිසුම අත්සන් කළ රජතුමා කවුද?
   1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
   2. දෙවන රාජසිංහ රජු
   3. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු
   4. ශ්‍රී විජය රාජසිංහ රජු

9) ලන්දේසි අධිකරණ සංවිධානය යටතේ මහාධිකරණය හැඳින් වූ නම වන්නේ,

1. රාද්වැන් ජස්ටිට් 2. සිවිල් රාද්
3. ලැන්ඩ් රාද් 4. පිස්කල් උසාවිය

10) ඉංග්‍රීසින් පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගනු ලැබූ අවස්ථාවේ උඩරට රාජධානිය පාලනය කළ රජතුමා වන්නේ,

1. ශ්‍රී විජය රාජසිංහ රජු 2. රාජාධි රාජසිංහ රජු
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 4. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

11) 1762 කීර්ති ශ්‍රී රාජසිංහ රජු මුණගැසීමට පැමිණි පළමුවන ඉංග්‍රීසි දූතයා වන්නේ,

1. ජෝන් ෆයිබස් 2. රොබට් ඇන්ඩෘෂ්
3. හියු බොයිඩ් 4. ජොන් ඩොයිලි

12) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවසන් ලන්දේසි ආණ්ඩුකාරවරයා වන්නේ,

1. බැරන් වැන් එක් 2. විලෙම් පැලක්
3. ෆන් එංගල්බෙක් 4. ස්පිල්බර්ජන්

13) මහ බද්දේ දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබුවේ,

1. ගම්මිරිස්වලටය 2. එනසාල්වලටය
3. කරුදමුංගුවලටය 4. කුරුඳු වලටය

14) "ද මියුරන් කොමිසම" පාලනයට පැමිණියේ කුමක පාලන ක්‍රමයට පසුවද?

1. සමාගම් පාලනයට පසුවය 2. ද්විත්ව පාලනයට පසුවය
3. කිරීට පාලනයට පසුවය 4. පළමු නිදහස් සටනට පසුවය

15) 1815 උඩරට ගිවිසුම ඇති වන විට සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වන්නේ,

1. රොබට් බ්‍රවුන්රිග් 2. තෝමස් මේට්ලන්ඩ්
3. ෆෙඩ්රික් නෝර්ත් 4. එඩ්වඩ් බාන්ස්

16) පළමු නිදහස් සටනින් පසු බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දෙන ලද ප්‍රතිසංස්කරණය කුමක්ද?

1. මැනිං ප්‍රතිසංස්කරණය 2. ඩොනමෝර් ප්‍රතිසංස්කරණය
3. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය 4. කොල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය

17) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු රජ වීමට පෙර භාවිතා කළ නාමය වන්නේ,

1. මුත්තුසාමි කුමරු 2. කන්නසාමි කුමරු
3. කුණ්ඩසාලේ කුමරු 4. ටිකිරි කුමරු

18) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට වගා කළ ප්‍රථම වාණිජ බෝගය වන්නේ,

1. කුරුඳු වගාව 2. එනසාල් වගාව
3. කෝපි වගාව 4. පොල් වගාව

19) 1848 නිදහස් සටනේ දී ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි රාජසිංහ නමින් ඔටුනු පැළඳ වූ නායකයා කවුරුන්ද?

1. ඩිංගිරාළ 2. ගොන්ගාලේගොඩ බණ්ඩා
3. පුරන් අප්පු 4. කඩහපොල හිමියන්

20) ශ්‍රී ලංකාවේ පළමුවන පොල් පර්යේෂණායතනය පිහිටුවන ලද ප්‍රදේශය වන්නේ මින් කුමක්ද?

1. ලුණුවිල
2. අගලවත්ත
3. තලවකැලේ
4. මාතලේ

## II කොටස


- පළමුවන ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යයි. ඉතිරි ප්‍රශ්නවලින් 04 කට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 05 කි.

---

1)


A. පහත රූප දෙස බලා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A රූපය



i. A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
ii. මෙහි දැක්වෙන සමාගම සඳහන් කරන්න.
iii. මෙම සමාගමට අයත් යුරෝපා ජාතිය සඳහන් කරන්න.
iv. මෙම සමාගමේ දූතයෙකු ලංකාවට පැමිණි වසර ලියන්න.

B රූපය



i. B පින්තූරයෙන් දැක්වෙන ස්ථානය කුමක්ද?
ii. එහි අත්සන් කරනු ලැබුවේ කුමක්ද?
iii. එහි වගන්ති ගණන කියද?
iv. එය ඇත්තේ කුමන ස්ථානයේ ද?

(ලකුණු 02 x 08 = 16 යි)

2)

i. ලන්දේසීන්ගේ කොමාන්ඩරි දෙකක් දක්වන්න. (ලකුණු 02 යි)
ii. 1638 ගිවිසුමේ වගන්ති හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
iii. ලන්දේසී පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට ඕලන්ද රජය වෙනුවෙන් කිරීමට ලැබුණු බලතල හතරක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

3)

i. ~~උඩරට රජවරු හා ලන්දේසී~~ දූත සබඳතාවල දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02 යි)
ii. ලන්දේසීන් රජුට දුන් තෑගි හතරක් දක්වන්න. (ලකුණු 04 යි)
iii. ලන්දේසී පරිපාලන අංශයේ අවස්ථා දක්වමින් එම පාලනය සිදුකළ අයුරු විස්තර කරන්න. (ලකුණු 05 යි)

4)

i. ලන්දේසි ක්‍රියාත්මක කළ තෝම්බු වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

ii. ලන්දේසීන්ගෙන් ආර්ථික රටාව තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

iii. ලන්දේසී පාලනයේ සමාජ සංස්කෘතිය ක්ෂේත්‍රයේ ඇති වූ බලපෑම කරුණු **තුනක්** දක්වා ඉන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

5)

i. ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

ii. ශ්‍රී ලංකාවේ මහනුවර රජවරු මුණගැසීමට පැමිණි ඉංග්‍රීසි දූතවරුන් **දෙදෙනෙක්** හා ඔවුන් හමු වූ රජවරු **දෙදෙනෙක්** දක්වන්න. (ලකුණු 04 යි)

iii. 1803 ෆෙඩ්රික් නෝර්ත්ගේ උඩරට ආක්‍රමණය ඇති වීමට බලපෑ හේතු **තුනක්** දක්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

6)

i. 1815 කන්ද උඩරට ගිවිසුමේ සඳහන් වගන්ති **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 02 යි)

ii.

A. 1818 සටනට නායකත්වය ලබා දුන් නායකයන් **දෙදෙනෙක්** ද

B. ටොරිංටන් සාමි ආණ්ඩුකාරයා විසින් පනවන ලද බදු **දෙකක්** ද දක්වන්න. (ලකුණු 04 යි)

iii. 1818 පළමුවන නිදහස් සටන ඇති වීමට බලපෑ හේතු වූ කරුණු **තුනක්** දක්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

7)

i. ඉංග්‍රීසින් වගාකළ ලංකාවේ වාණිජ බෝග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

ii. එම බෝගවලින් එක් බෝගයක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 04 යි)

iii. ක්‍රි.ව 1850 න් පසු බ්‍රිතාන්‍ය ආණ්ඩුව කෘෂිකර්මාන්තය නගා සිටුවීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග **දෙකක්** දක්වා ඒවා විස්තර කරන්න. (ලකුණු 05 යි)